# වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් කාන්තා අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන වෙත ඇති වූ සෘණාත්මක බලපෑම අවම කිරීම අරභයා ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් ලබා දුන් දායකත්වයන්




පර්යේෂණ සහ සවිබල ගැන්වීම සඳහා වන මුස්ලිම් කාන්තාවන්ගේ සංගමයේ කාර්යමණ්ඩලයට කෝවිඩ් 19 වසංගතය සඳහා වන සනීපාරක්ෂක උපකරණ බෙදා දීම (මඩකලපුව දිස්ත්‍රික්කය)

වසර 2020 සිට 2022 දක්වා කාල වකවානුව විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාකූල සහගත තත්වයක් ඇතිවූ කාල වකවානුවක් වූ අතර, රට තුළ ඇතිවෙමින් පැවති දරුණුතම දේශපාලනික හා ආර්ථික අර්බුදය, කෝවිඩ් 19 වසංගතයත් සමඟ තවත් උග්‍ර වීම මෙයට හේතු විය. 1948 දී නිදහස ලැබීමෙන් පසුව ඇතිවූ දරුණුතම අර්බුදය මෙය වන අතර මේ සියල්ල මානුෂීය අර්බුදයක් දක්වා ඉහළ ගියේය. වසංගතයෙන් සහ සහ ඉන් පසුව ඇති වූ මානුෂීය ආර්ථික අර්බුදය හේතුවෙන් විවිධ ආකාරවල දරුණු මට්ටමේ ගැටලු රාශියක් පැන නැගුණි, ඇතැම් විට ඒවා පුරෝකථනය කිරීම දුෂ්කර වූ අතර සමාජ, දේශපාලන හා ආර්ථික මානයන් දක්වා ඒවා විහිදුණි . ශ්‍රී ලංකාව කෝවිඩ් 19 රැලි සහ ප්‍රභේද කිහිපයකට, රට වසාදැමීම් (ලොක්ඩවුන්) කිහිපයකටම මුහුණ දුන්නේ, ඉන්ධන හිඟය, පැය 13ක විදුලිය ඇනහිටීම්, අහස උසට නැගෙන ආහාර උද්ධමනය, ආනයන සීමා කිරීම්, ඖෂධ මදිකම සහ මතුවෙමින් පවතින ආහාර හිඟයක් ද සහිත වූ ආර්ථික අර්බුදයක් වෙත අවසානයේ ඇද වැටෙමිනි.

මෙම සන්දර්භයන් තුළ සිට ක්‍රියාත්මක වන විට මුහුණ දීමට සිදුවන පසුබෑම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය (WVL-SL) ව්‍යාපෘති හවුල්කරුවන් වන සහ නොවන, රට පුරා ක්‍රියාත්මක වන කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන (WROs) මඟින් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් කාන්තාවන් හා ගැහැණු දරුවන් මුහුණ දුන් ගැටලු සඳහා ඒවා මතුවන අවස්ථාවේදීම ප්‍රතිචාර දැක්වීමේ කටයුතු ද, ඔවුන් වසංගතයට පෙර ආරම්භ කළ ක්‍රියාකාරකම් හා සමගාමීව පවත්වාගෙන යන ලදි.

නම්‍යශීලී, අනුවර්තනය වන සුළු සහ ප්‍රතිචාරාත්මක කළමනාකරණ ශෛලියක් අනුගමනය කරන ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් වසංගත සහ ආර්ථික අර්බුදය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය අරභයා එහි හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට මග පෙන්වීමට සහ සහාය වීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල ගැටලුවලට ප්‍රතිචාර දැක්වීමේදී භාවිතා කළ සිද්ධියෙන් සිද්ධිය ඇමතීමේ ප්‍රවේශය හේතුවෙන් සිය හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල ගැටලු සඳහා ඔවුන් සමඟ තනි තනිව මෙන්ම එම සංවිධානවලට අනන්‍ය වූ අවශ්‍යතාවලට සරිලන පරිදි සහය ලබා දීමට මෙම ව්‍යාපෘතියට හැකි වූ අතර, විශේෂයෙන් වසංගතය සහ ඒ සමඟ ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධන වෙත ඇති වූ සියුම් බලපෑම් ආමන්ත්‍රණය කිරීමේදී මෙම ක්‍රමය වඩා ඵලදායී බව සනාථ විය. උදාහරණ ලෙස, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන වල භූගෝලීය පිහිටීම අනුව ඒවා දැඩි කෝවිඩ් 19 අවදානමක් සහිත හෝ අඩු කෝවිඩ් 19 අවදානමක් සහිත කලාපයක පිහිටා තිබේද මත; ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉලෙක්ට්‍රොනික උපාංග නොමැතිකම හේතුවෙන් ඇතැම් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට මාර්ගගත ක්‍රමවේදයට යොමුවීමේ අපහසුව; ප්‍රතිලාභීන් සතුව ඉලෙක්ට්‍රොනික් උපාංග නොමැතිකම වැනි හේතු මත වසාදැමීමේ (ලොක්ඩවුන්) කාලසීමාවන්වලදී ඇතැම් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට ප්‍රතිලාභීන් හා සම්බන්ධ වීමට පැවති අපහසුතා; කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මුහුණ දුන් විවිධ ආකාරයේ ගැටලුවලින් කිහිපයකි.

ව්‍යාපෘතිය තුළ අන්තර්ගත ස්ත්‍රීවාදී මූලධර්මවලට අනුකූලව යමින්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින්, සිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මුහුණ දෙන ගැටලු, අභියෝග සහ අවදානම් තත්ත්වයන් සම්පූර්ණයෙන් අවබෝධ කරගෙන ඒවාට විසඳුම් ලබා දෙන අතර ම වසංගතය සහ ආර්ථික අර්බුදයට අදාලව ඔවුන්ගේ ප්‍රතිලාභීන් මුහුණ දෙන ගැටලු (පැන නගින ගැටලුවලට ගැලපෙන පරිදි කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ අරමුදල (Rapid Response Fund) හෝ බහු වාර්ෂික අරමුදල් සැපයීමේ ක්‍රියාකාරකම් අනුගමනය හරහා වැනි) සහ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් මුහුණ දෙනු ලබන ගැටලු (ධාරිතාව වැඩිකිරීමේ අවශ්‍යතා වැනි) වලට අදාලව ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් විසින් යොමු කරන ලද අදහස් සහ ඉල්ලීම්වලට ප්‍රතිචාර සහ සහාය දැක්වීම සඳහා වග බලා ගන්නා ලදී. සමස්තයක් වශයෙන් ගත් කළ, මතුවන විවිධ තත්ත්වයන් ඔස්සේ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මෙහෙයවීම ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය සඳහා අභියෝගාත්මක අත්දැකීමක් වුවද, එය මෙම ව්‍යාපෘතියට සහ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් හට ඔවුන්ගේ වැඩකටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා නව ක්‍රමවේද ගවේෂණයට සහ නව්‍ය ප්‍රවේශයන් නිර්මාණය කිරීමට ඉඩ ලබා දුන්නේය.

## වෙනස්වන තත්ත්වයන්ට අනුකූලව ක්‍රියාත්මක වීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල සංවිධානාත්මක හැකියාවන් ශක්තිමත් කිරීම

### කෝවිඩ් 19 වසංගතය තුළ ක්‍රියාත්මක වීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල ධාරිතාවන් ශක්තිමත් කිරීම

කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන්, කාන්තාවන්ගේ ගැටලු, කාන්තාවන් සවිබල ගැන්වීම සහ කාන්තා අයිතිවාසිකම් හා අදාළ සිය බිම් මට්ටමේ කටයුතු සිදුකරගෙන යෑම අරභයා සියලුම කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන සඳහා ධාරිතා සංවර්ධන මැදිහත්වීම් සිදුකිරීමේ කඩිනම් අවශ්‍යතාවයන් නිර්මාණය විය.

උපකරණ සැපයීම හාරහා සංවිධානත්මක හැකියාවන් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් සියලුම බහු-වාර්ෂික අරමුදල් (MYF) හවුල්කරුවන් වෙත කැනේඩියානු ඩොලර් 9000ක වටිනාකමකින් යුතු සනීපාරක්ෂක උපකරණ සහ සැපයුම් ලබා දෙන ලදී. කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන බිම් මට්ටමේ ක්‍රියාකාරකම් සිදුකරන බැවින්, බොහෝ දෙනෙක් මුල් පෙළ ප්‍රතිචාර දක්වන්නන් ලෙස ක්‍රියා

කරන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ප්‍රජාවේ සාමාජිකයින් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීම අවශ්‍ය වේ. මේ හේතුවෙන්, සනීපාරක්ෂක උපකරණ සහ සැපයුම් සැපයීම, විශේෂයෙන් කෝවිඩ් 19 වසංගතයෙහි "අධි අවදානම්" කලාපවල ක්‍රියාත්මක වන කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන්ට ඔවුන් සේවය කරන ප්‍රජාවන් සමඟ ආරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් අඛණ්ඩව සම්බන්ධ වීමට ඉතා ප්‍රයෝජනවත් විය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් සපයනු ලැබූ අයිතමයන් ආබාධ සහිත පිරිස් සඳහා හිතකාමී බවට ද ඔවුන් විසින් සහතික කරගන්නා ලදි. මීට අමතරව, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් සෑම හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයකටම එක් ලැප්ටොප් පරිගණකයක් සහ එක් අන්තර්ජාල ඩොංගලයක් බැගින් (මුළු එකතුව 26ක්) අමතර ප්‍රතිලාභයක් ලෙස වසර තුනක වගකීමක් සහිත ස්ථානීය තාක්ෂණික සේවාක්ද  ලබා දුන්නේය. කෝවිඩ් 19 ආශ්‍රිත වසාදැමීම් සහ සංචරණ සීමාවන් ලිහිල් කිරීම සිදු වුවද, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් හැකි සෑම විටම අන්තර්ජාලය හරහා වැඩසටහන් පැවැත්වීම දිගටම කරගෙන ගිය බැවින් මෙම ආයෝජනයෙහි අවශ්‍යතාවය වඩ වඩාත් තහවුරු විය. කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට තාක්ෂණය එකතු කරගැනීමට ද එමඟින් ඉඩ සැලසිණි. බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් ලැප්ටොප් සහ අන්තර්ජාල සම්බන්ධතා හේතුවෙන් තම කාර්යයන් වල ඵලදායිතාවයේ වැඩි වීමක් වාර්තා කළේය. ඇතැමුන් ප්‍රකාශ කළ පරිදි, මෙය සංවිධානය සතු වූ පළමු ලැප්ටොප් පරිගණකය විය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ භෞතික/මිනිස් ශ්‍රමය භාවිතයෙන් සිදු කරන ක්‍රමවේදවල සිට පරිගණකය හරහා සිදුකෙරෙන ක්‍රමවේද වෙත මාරුවීම සමහර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන සඳහා දුෂ්කර විය. මෙයට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන වශයෙන් මයික්‍රොසොෆ්ට් ටීම්ස් (Microsoft Teams) සහ සූම් (Zoom) යන මාර්ගගත වේදිකාවන් භාවිතය (සහ ආචාර විධි) පිළිබඳ ධාරිතාව ගොඩනැගීමේ සැසි පවත්වන ලදී. මෙම ධාරිතා ගොඩනැගීම ඔස්සේ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට රැස්වීම්, තොරතුරු බෙදාගැනීම් සහ ජාලකරණ වැඩසටහන් සහ ඇතැම් අවස්ථාවල පුහුණු සැසි පවා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීම සඳහා හැකියාව ලැබිණි.



ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් බහු-වාර්ෂික අරමුදලේ (MYF) හවුල්කරුවන් වන කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන 26 ක් වෙත ලැප්ටොප් පරිගණක බෙදා දීම

සියලුම කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන කෙරෙහි අදාළ ලෙස සිදු කෙරුණු මාර්ගගත වේදිකා භාවිතා කිරීමේ ධාරිතා ගොඩනැගීමේ සැසියට අමතරව, වෙනස් වූ තත්ත්වයන් තුළ නව ක්‍රමවේද නිර්මාණයට, ව්‍යාපෘති මැදිහත්වීම් අදාළ සන්දර්භයන්ට අනුගත කිරීමට සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අරභයා තනි තනි වශයෙන් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල නිශ්චිත කුසලතා සහ ධාරිතා ගොඩනැගීම අවශ්‍ය බව ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් හඳුනාගැණින. එම ව්‍යාපෘතිය මඟින්, නව බහු වාර්ෂික අරමුදල් ව්‍යාපෘතිවල අදියරයන් සඳහා සංවිධානයන්හි නිශ්චිත වූ ධාරිතා ශක්තිමත් කිරීම පිළිබඳ අංගයන් ඒකාබද්ධ කිරීමේ අදහස ගෙන එන ලදි. නිදසුනක් වශයෙන්, ගාල්ල ප්‍රදේශයේ කාන්තා මධ්‍යස්ථානය (Women's Center – Galle) විසින් තම උපදේශනයන් සඳහා ජංගම දුරකථන මගින් මාධ්‍යකරණය පිළිබඳ ධාරිතාව ගොඩනැගීම ඇතුළත් කරගත්තේය. අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය (Association of Women with Disabilities – AKASA) මඟින් සිය කාර්යය මණ්ඩලයට, සංගමයේ සමාජ මාධ්‍ය තුළ තම පැවැත්ම ආරම්භ කිරීම අරභයා, සමාජ මාධ්‍ය හා අදාළ උපදේශනය පිළිබඳ පුහුණුවක් පවත්වන ලදි. ගාල්ල ප්‍රදේශයෙහි පිහිටි ග්‍රාමීය කාන්තා පෙරමුණ (Rural Women's Front) විසින් සමාජ මාධ්‍ය සහ අලෙවිකරණය පිළිබඳ සිය කාර්ය මණ්ඩලයෙහි සහ ස්වේච්ඡා සේවකයන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම මෙන්ම තිරසාර පියවරක් වශයෙන් විකල්ප ආදායම් මාර්ග ගවේෂණය කිරීම පිළිබඳ අංගයක් ද සහිත පුහුණු සැසියක් ඇතුළත් කරගන්නා ලදි. මෙම ප්‍රවේශය කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් මින් පෙර අත්දැක තිබෙන ආකාරයේ කාර්යමණ්ඩල සංවර්ධනය කෙරෙහි අවධානය යොමු නොකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් සහාය ලබා දුන් සම්ප්‍රදායික දායක අරමුදල් ලබාදීම් වලින් බැහැරවීමක් විය. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස මතුවන, සංවිධානයන්හි ධාරිතාවන් ගොඩනැගීමේ අවශ්‍යතා විසඳීම සඳහා බහු වාර්ෂික අරමුදල් ප්‍රදාන චක්‍රයේ තෙවන අදියර දක්වා මෙය දිගටම පැවතුනි.

කෙසේ වෙතත්, බොහෝ හවුල්කරුවන් තත්ත්වයන්ට අනුවර්තනය වීමට සහාය ඉල්ලා සිටි බැවින්, විශේෂයෙන් ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් තනි තනි වශයෙන් අඛණ්ඩව සහය ලබා දීම සිදු කෙරිණි. මෙසේ සිදු කිරීමේදී, ව්‍යාපෘතිය මඟින්, එක් එක් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානය සමඟ තනි තනිව සැසි (එක් සංවිධානයක් සඳහා සාමාන්‍යයෙන් පැය අටක් පමණ වන සාකච්ඡා) පැවැත්වීය. ධාරිතා ගොඩනැගීම තුළින් හවුල්කරුවන්ට ඔවුන්ගේ වැඩ විචාරාත්මකව සමාලෝචනය කිරීමට සහ කෝවිඩ් 19 තත්ත්වයන් හරහා ගමන් කිරීම අරභයා නව ප්‍රවේශයන් සැලසුම් කිරීමට උපකාරී වුනු අතරම කාන්තා අයිතිවාසිකම් සහ සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ දැඩි කැපවීම ද පිළිබිඹු කරන ලදි.

### ආර්ථික අර්බුදය අතරතුර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල ධාරිතාවන් ශක්තිමත් කිරීම

Feminist Collective for Economic Justice වෙතින් පැමිණි සම්පත් දායකයින්ගේ සහභාගිත්වයෙන් ආර්ථික අර්බුදය කෙරෙහි ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයන් පිළිබඳව කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් සමඟ දැනුම බෙදාගැනීමේ සැසියක් පවත්වන ලදී. ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් බහුලව පවතින (සහ බොහෝ විට තාක්ෂණික වශයෙන් සංකීර්ණ භාෂාවන් භාවිතා කරන) තොරතුරු ඔස්සේ යමින් ඒවා පැහැදිළි කරගැනීම සඳහා, ආර්ථික අර්බුදයෙහි පසුබිම සහ එයට හේතු වූ සාධක පිළිබඳ මූලික පැහැදිලි කිරීමක් මෙහිදී ලබා දෙන ලදී. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස අවදානමට ලක්විය හැකි මහජනයා/සමාජයන් මුහුණ දෙන විශේෂිත ගැටලු පිළිබඳව සම්පත් දායකයන් තවදුරටත් කතා කළහ. මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශ වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (GBV) අදාළ සිදුවීම් ඉහළ යාම, කාන්තාවන් මූලිකත්වය දරන පවුල් (FHH) මුහුණ දෙන ගැටලු, අවිධිමත් අංශයේ කාන්තාවන්, දික්කසාද වූ කාන්තාවන් සහ නඩත්තු කිරීම් සහ ගෙවීම් නොලබන අමතර සත්කාර කටයුතුවලට අදාළ ගැටලු ආදී කාන්තාවන් මුහුණ දෙන ගැටලු දීර්ඝ ලෙස මෙහිදී සාකච්ඡා කෙරිණ. ආහාර සුරක්ෂිතතාවය සාකච්ඡා කෙරුණු තවත් එක් ප්‍රධාන මාතෘකාවක් වූ අතර බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් විසින් ප්‍රජාව තුළින් ඉස්මතු වූ

කතා ද සමඟින් මෙය සනාථ කරන ලදි. ළමුන් සම්බන්ධ ගැටලු, අධ්‍යාපනය කෙරෙහි ප්‍රවේශය සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් ද මෙහිදී සාකච්ඡා කෙරිණි. සමස්තයක් වශයෙන්, මෙම දැනුම බෙදාගැනීමේ සැසිය පිළිබඳ ලැබුණු ප්‍රතිපෝෂණයන් ධනාත්මක ඒවා විය. ආර්ථික අර්බුදය අවබෝධ කර ගැනීමට මෙම සැසිවාරය ප්‍රයෝජනවත් වූ බව බොහෝ දෙනෙකු විසින් පිළිගන්නා ලදි. එහෙත් වඩාත්ම වැදගත් කාරණය නම්, බහු වාර්ෂික අරමුදල් (MYF) ප්‍රදාන චක්‍රයේ තුන්වන අදියර සඳහා වන ඔවුන්ගේ ව්‍යාපෘති යෝජනා තුළ ආර්ථික අර්බුදයට අදාළ ගැටලු විසඳීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් සමත් වීමයි.

## වෙනස්වන තත්ත්වයන්ට ගැලපෙන ලෙස ව්‍යාපෘති මැදිහත්වීම් සහ උපායමාර්ගයන් අනුගත කිරීමට කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට සහය දැක්වීම

### කෝවිඩ් 19 වසංගතය සමඟ ඇතිවූ අභියෝගයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ව්‍යාපෘති මැදහත්වීම් අනුගත කිරීම සහ උපායමාර්ගයන් වෙනස් කිරීම

තම ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අන්තර්ජාල අවකාශයන් වෙත මාරු වීමට අවශ්‍ය වූ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් හට මාර්ගගත වේදිකා භාවිතය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ප්‍රයෝජනවත් විය. ගාල්ල ප්‍රදේශයේ පිහිටි කාන්තා මධ්‍යස්ථානය (Women's Center – Galle) සහ ගම්පහ ප්‍රදේශයේ නිමි භාණ්ඩ ඇඟලුම් හා රෙදිපිළි සේවක සංගමය (Textile Garment and Clothing Workers Union – TGCWU) විසින් තම ඉලක්කගත ප්‍රතිලාභීන් තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ බව සහ ඔවුන්ට සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශය ඇති බව හඳුනා ගත් අතර, එබැවින් ඔවුන් විසින් සිදු කරනු ලැබූ උපදේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් තම සෘජු ප්‍රතිලාභීන් වන අපනයන සැකසුම් කලාපවල ශ්‍රමිකයන් අඩංගු වන සමාජ මාධ්‍ය වේදිකා සහ වට්ස්ඇප් ජාලයන් වෙත අනුගත කරන ලදී.

කෙසේ වෙතත්, අන්තර්ජාලය භාවිතයෙන් මාර්ගගතව ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වෙත මාරුවීම සියලුම සංවිධාන සඳහා කළ හැකි නොවීය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සුභසාධන අධ්‍යාපනික සහ දැනුවත්භාවයේ මධ්‍යස්ථානය (Society for Welfare Educational and Awareness Training – SWEAT) සහ සමාජ සුබසාධන පදනම (Social Welfare Mandram – SWM) විසින් වතුකරයේ ප්‍රජාවන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ උද්දේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරිණ. මෙම ප්‍රජාවන් තාක්ෂණය සඳහා අඩු ප්‍රවේශයක් සහිත ආර්ථික, සමාජීය සහ දේශපාලනික වශයෙන් අඩු ප්‍රතිලාභ ලබන ප්‍රජාවන් ලෙස හැඳින්වේ. එබැවින්, SWEAT සහ SWM යන සංවිධාන දෙකම විසින් තමන් අන්තර්ජාල අවකාශයන් වෙත මාරු වීම සුදුසු නොවන බව හඳුනා ගත් අතර ඒ වෙනුවට, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි සහාය ඇතිව, සිය ක්‍රියාකාරකම් හැකි සෑම විටම කුඩා කණ්ඩායම් සමඟ පුද්ගලිකව වැඩ කිරීම හෝ කෝවිඩ් 19 සංචරණ සීමාවන් තුළ මෙම ප්‍රජාවන්ට වඩා හොඳ ප්‍රවේශයක් සහිත පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කිරීම ඔස්සේ සිදුකිරීමට අනුගත විය. බදුල්ල ප්‍රදේශයේ කාන්තා පිහිට (Women In Need – WIN) ආයතනය ද එවැනිම ගැටලුවකට මුහුණ දුන් අතර වතු කළමනාකරණයට සම්බන්ධ නිලධාරීන් (වතුකර මානව සංවර්ධන අරමුදල - Plantation Human Development Trust), සුබසාධන නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් සහ වතු අංශයට අනුයුක්ත ළමා ආරක්ෂක නිලධාරීන් හා එක්ව වතුකරය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට සැලසුම් කළහ.

රට වසාදැමීම (ලොක්ඩවුන් අවස්ථාවන්) සහ කෝවිඩ් 19 ආශ්‍රිත සංචරණ සීමා පැනවීම් යනාදිය තම ප්‍රතිලාභීන් සමඟ සමීපව කටයුතු කිරීම අවශ්‍යව තිබූ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන සඳහා බාධාකාරී විය. මෙවන් අවස්ථාවලදී, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හානායකත්වය ව්‍යාපෘතිය විසින් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට සිය උපායමාර්ගයන් නැවත සකස් කිරීමට සහය වීම සඳහා පියවර ගන්නා ලදි. නිදසුනක් ලෙස, ගම්පහ ප්‍රදේශයෙහි ස්ටෑන්ඩ් අප් මූව්මන්ට් ලංකා (Stand Up Movement Lanka – SUML) ව්‍යාපාරය, වාණිජ ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අතර නිරන්තරයෙන් ලිංගික ශ්‍රමික ප්‍රජාව සමඟ සමීප සම්බන්ධතා පවත්වයි. කෙසේ වෙතත්, රට

වසාදැමීම් නිසා තවදුරටත් ලිංගික ශ්‍රමික ප්‍රජාවන්ට පොදු ස්ථානවල සිට සේවාදායකයින් හා සම්බන්ධ නොවීම හේතුවෙන් ලිංගික ශ්‍රමිකයින් සොයා ගැනීම දුෂ්කර විය. එබැවින් මෙම සංවිධානය විසින් ලිංගික ශ්‍රමිකයන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා සකස් කළ තම ප්‍රවේශයෙහි වූ උපායමාර්ග නැවත වෙනස් කර, ඔවුන් සඳහා නීතිමය සහය ලබා දීමට නීතීඥයින් සමඟ එක්ව කටයුතු කළහ.

ව්‍යාපෘතිය ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද මූලික මට්ටමේ සහ ධාරිතාවන් පිළිබඳ තක්සේරු කිරීම්වල සොයා ගැනීමක් වූයේ බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට සාක්ෂි මත පදනම් වූ වැඩසටහන්කරණය පිළිබඳ දැනුම සහ අත්දැකීම් නොමැති බවයි. කෝවිඩ් 19 තත්ත්වය විසින් පවතින සන්දර්භයන් පිළිබඳ කුඩා පරිමාණ පර්යේෂණ/ඇගයීම් සිදු කිරීමට සහ ඒවායේ සොයාගැනීම් මත පදනම් වෙමින් ක්‍රියාකාරකම් ගොඩනැගීමට සිය හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් දිරිමත් කිරීම අරභයා ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට කදිම අවස්ථාවක් ලබා දුන්නේය. නිදසුනක් වශයෙන්, අම්පාර දිස්ත්‍රික්කයේ පීඩාවට පත් කාන්තාවන්ගේ මණ්ඩපය (Affected Women's Forum – AWF) විසින් ප්‍රජාව තුළ සිටින කාන්තාවන් වෙත කෝවිඩ් 19 හි බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදී. ගාලු දිස්ත්‍රික්කයේ RWF විසින් සංචාරක කර්මාන්තය තුළ සිටින අවිධිමත් කාන්තා ව්‍යවසායකයින් වෙත කෝවිඩ් 19 හි බලපෑම පිළිබඳව තක්සේරුවක් සිදු කරන ලදී.

### ආර්ථික අර්බුදය සමඟ ඇතිවූ අභියෝගයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ව්‍යාපෘති මැදිහත්වීම් අනුගත කිරීම සහ උපායමාර්ගයන් වෙනස් කිරීම.

බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් පළමු හා දෙවන අදියරයන්හි සිදු කරන ලද තම කාර්යයන් තව දුරටත් පවත්වාගෙන යෑමක් ලෙස ඔවුන්ගේ බහු වාර්ෂික අරමුදල් ප්‍රදානයන්වල තුන්වන අදියර ගොඩනගන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි සහය ද ඇතිව, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් විසින් ආර්ථික අර්බුදය හේතුවෙන් මතුවන ගැටලුවලට සෘජුවම අදාලවන මැදිහත්වීම් ද මෙහි ඇතුළත් කර ඇත. ප්‍රායෝගික ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ සිට ආර්ථික අර්බුදයට ඔරොත්තු දීම සඳහා (ආදායම් උත්පාදන ක්‍රම වැනි) උපාය මාර්ගික ස්ත්‍රී පුරුෂ සමාජභාවීය රූඪිකත්වයන් සහ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම කෙරෙහි හවුල්කරුවන්ගේ අවධානය යොමු කරවීමට මෙය හරහා ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට අවස්ථාව ලැබිණි. නිදසුනක් වශයෙන්, අම්පාර ප්‍රදේශයේ පිහිටි AWF විසින් දැනුවත්භාවය වැඩිකිරීමේ උපායමාර්ගයක සිට අම්පාර ප්‍රදේශය තුළ කොන් කිරීම්වලට ලක්වූ කාන්තාවන්ගේ ජීවන කුසලතා සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ගයක් වෙත යොමු විය. කාන්තාවන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි කර්මාන්තයක් ලෙස AWF විසින් හඳුනාගනු ලැබූ කරවල වෙළඳාම සඳහා පවතින දේශීය වෙළඳ අවස්ථාවන් සැලකිල්ලට ගනිමින්, AWF විසින් මෙසේ කොන් කිරීම්වලට ලක්වූ කාන්තාවන් සඳහා මාළු වියලීමේ තාක්ෂණික කුසලතා දියුණු කරගැනීම සඳහා පුහුණු වැඩසටහනක් සැලසුම් කළේය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි නිර්දේශ ද සහිතව, AWF විසින් ප්‍රධාන රාජ්‍ය ආයතනවල තාක්ෂණික සම්පත්දායකයන් පුහුණු කිරීම් සඳහා ගෙන්වා ගත් අතර, එය කාන්තාවන්ට ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කරගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය, ස්වාධීනත්වය, සහ ආත්ම විශ්වාසය ශක්තිමත් කරගැනීමට උපකාරී වන දැනුම හා කුසලතා සඳහා ප්‍රවේශය වැඩි කරවීමට ඉවහල් විය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීම අරභයා සිය ව්‍යාපෘතිවලට සහය දැක්වීම සඳහා සුදුසු විශේෂඥයින් සහ සම්පත් දායකයන් තෝරා ගැනීමට තම හවුල්කරුවන් දිරිමත් කරයි.

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් ආර්ථික අර්බුදය අතරතුරදී සාක්ෂි මත පදනම් වූ වැඩසටහන්කරණයක් අනුගමනය කිරීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් වෙත අඛණ්ඩව සහාය දැක්වීය. බහු වාර්ෂික අරමුදල් ප්‍රදානයන්හි තුන්වන අදියර සඳහා, කාන්තා හා සංවර්ධන මධ්‍යස්ථානය (CWD) විසින් උතුරු පළාතේ දිස්ත්‍රික්ක තුනක ග්‍රාමීය කාන්තාවන් වෙත ආර්ථික අර්බුදයෙන් ඇතිවූ බලපෑම පිළිබඳ පර්යේෂණ කිරීමට



අම්පාර දිස්ත්‍රික්කයේ බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සංසදය (Affected Women's Forum – AWF) විසින් කාන්තා ප්‍රතිලාභීන් උදෙසා සංවිධානය කරන ලද විකල්ප ජීවනෝපායක් වශයෙන් මාළු වියලීමේ තාක්ෂණික කුසලතා දියුණු කරගැනීම සඳහා වූ පුහුණු වැඩසටහන

සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා කාන්තාවන් 90 දෙනෙකුට ආර්ථික කුසලතා පුහුණු කිරීම් සැපයීමට සැළසුම් කරයි. ගුණාත්මකභාවය සහතික කිරීම අරභයා, ආර්ථික අර්බුදය හේතුවෙන් උතුරු පළාතේ ග්‍රාමීය කාන්තාවන් මුහුණ දෙන අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම හා අදාළව, පාර්ශ්වකරුවන් සඳහා නිර්දේශයන් ද සහිතව ආර්ථික අර්බුදයේ බලපෑම් පිළිබඳ වාර්තාවක් කෙටුම්පත් කිරීම සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විද්වතුන් සමඟ කටයුතු කරන මෙන් CWD වෙත ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් සහයෝගය දෙන ලදි. එම නිර්දේශ යාපනය ප්‍රදේශයෙහි සිටින රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. ලබා දුන් සහයෝගයන් හි ගුණාත්මකභාවය අවබෝධ කරගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයන්ගේ වින්දිතයින්ට ලබා දී ඇති නීති ආධාර සහය පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට ද CWD විසින් සැලසුම් කර ඇත

බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල මැදිහත්වීම් අතරට  කාන්තා ගෘහ මූලික නිවෙස්වල ආහාර සුරක්ෂිතතාවයට සහාය වීම ද ඇතුළත් විය. මෙම කර්තව්‍යයන්ගෙන් කිහිපයක් ගොඩනැගී ඇත්තේ, “ශ්‍රී ලංකාවේ කාන්තා ගෘහමූලික නිවාස සඳහා වන ආර්ථික සහන පැකේජය˝ (Economic Relief Package for Female Headed Households in Sri Lanka) නම් ආසියානු පදනමේ Lotus Circle හි හදිසි අරමුදල මඟින් අරමුදල් සපයනු ලබන කඩිනම් ප්‍රතිචාර ව්‍යාපෘතිය මතය. ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය පිළිබඳ දැනුම වැඩි කිරීම සඳහා ධාරිතාවන් ගොඩනැගීම, ගෙවතු වගාව පිළිබඳ කුසලතා වර්ධනය කිරීම, සහ අතිරික්ත නිෂ්පාදනයන් විකල්ප ආදායම් මාර්ගයක් බවට පත් කිරීම අරභයා කාන්තාවන්ගේ නිපුණතා ඉහළ නැංවීම වැනි මැදිහත්වීම් එයට ඇතුලත් විය. (සමාජ සුබසාධන මණ්ඩපය වැනි) ඇතැම් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මඟින් කාන්තාවන් හට කාබනික පොහොර නිෂ්පාදනයේ නිපුණත්වය ලබා දීම සඳහා අමතර සංරචක තම කටයුතු සඳහා ඇතුළත් කරගන්නා ලදි. පුහුණු වැඩසටහන් සඳහා සහාය වීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වැනි රාජ්‍ය නිලධාරින් සමඟ තවදුරටත් එක්ව කටයුතු කිරීමට ද කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මඟින් යෝජනා කරන ලදි.

පවුල්වල ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ වගකීම ගෘහය තුළ සිටින කාන්තාවන් මත පැවරීමේදී කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය ප්‍රවේශම් සහගත ලෙස කටයුතු කළේය. මෙහි බලපෑම අවම කිරීම අරභයා, ගෙවතු වගාව පිළිබඳ කුසලතා සංවර්ධන පුහුණුව සඳහා පවුලේ සිටින වයස අවුරුදු 18ට වැඩි පිරිමි සාමාජිකයෙකු ද කාන්තාවන් විසින් කැඳවාගෙන ආ යුතුය යන කරුණු ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයද කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන වෙත පෙන්වා දෙන ලදි. පවුලේ පිරිමි

සාමාජිකයා නිපුණතාවය ලබාගෙන පවුලේ සුබසාධනය සඳහා අර්ථවත් ලෙස දායක විය හැකි වයසක පසුවන බව සහතික කිරීම සඳහා වයස පිළිබඳ කොන්දේසිය ක්‍රියාත්මක කරන ලදී.

## මතු වන ගැටලු ආමන්ත්‍රණය කිරීම අරභයා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල අරමුදල් ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

### කෝවිඩ් 19 වසංගතය හා අදාළව අරමුදල් ලබාදීමේ ප්‍රභවයන්/මුලපිරීම්

කඩිනම් ප්‍රතිචාර අරමුදල හරහා, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් කෝවිඩ් 19 වසංගතයෙහි හි ප්‍රතිඵලයක් ලෙස මතුවන ගැටලු විසඳීම සඳහා වන මූලාරම්භයන් ක්‍රියාවට නැංවීම අරභයා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට සහාය සැපයීය. නිදසුනක් වශයෙන්, කාන්තා සංවර්ධන සංගමය (WDF) විසින් නිරෝධායන කාලපරිච්ඡේදයන්හි ප්‍රතිඵලයක් ලෙස ආදායම් අහිමිවීම සහ ගෘහස්ථ හිංසනය උග්‍රවන බව හඳුනාගන්නා ලදි. අනිවාර්ය නිරෝධායනයට ලක්වීම හේතුවෙන් දෛනික ආදායම අහිමි වූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් 40 දෙනෙකුට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ කෝවිඩ් 19 පිළිබඳ තොරතුරු පත්‍රිකා සහ (ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ට අදාළ සේවාවන් ඇතුළුව) රාජ්‍ය හා රාජ්‍ය නොවන ආධාරක පද්ධති සමඟ සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා සහයෝගය දක්වන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. කාන්තාවන් 40 දෙනෙකු හට ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීමට, ඔවුන්ගේ ගැටලු අවම කර ගැනීමට, මන්දපෝෂණයෙන් ඔවුන් ආරක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවක සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය දැනුම වෙත ප්‍රවේශය ලබා දීම මඟින් ඔවුන්ව අනිවාර්යයෙන්ම සවිබල ගැන්වෙන බැවින් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මෙම මැදිහත්වීමට සහය දක්වන ලදි. 'අර්බුද සහිත කාලයන් වලදී ස්ත්‍රීවාදී නායකත්වය' යන තේමාව යටතේ "ඩා බිඳු" සාමූහිකය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උත්සවයක් සඳහා සම සහයෝගය දැක්වීමක් වෙනුවෙන් එම සාමූහිකය විසින් අරමුදල් ඉල්ලා සිටින ලදි.

### ආර්ථික අර්බුදයට අදාළ අරමුදල් ලබාදීමේ මූලාරම්භයන්

කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මඟින් ආර්ථික අර්බුදය හේතුවෙන් මතුවන හෝ තවදුරටත් නරක අතට හැරෙමින් තිබූ, අවදානමට සහ කොන් කිරීම් වලට ලක්වූ ප්‍රජාවන්ගේ ක්ෂණික අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිළිබඳව සැලකිලිමත් වූ අතර මානුෂීය සහය සඳහා කඩිනම් ප්‍රතිචාර අරමුදල වෙත යොමු විය. කෙසේ වුවද, ආර්ථික අර්බුදයට හා අදාළ ගැටලු විසඳීම අරභයා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන මඟින් මානුෂීය ආධාර සඳහා කරන ඉල්ලීම් වැඩිවීම හේතුවෙන් කඩිනම් ප්‍රතිචාර අරමුදලෙහි අරමුණ යටපත් වූ බවක් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට හැඟිණි. මානුෂීය ආධාර යනු කඩිනම් ප්‍රතිචාර අරමුදලේ එක් අංගයක් පමණක් වන අතර මෙම කාලය තුළ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් උපායමාර්ගික සහ/හෝ නවමු ආකාරවල මුලපිරීම් සඳහා අරමුදල් සැපයීමේ සංරචක වෙත ප්‍රමුඛත්වය ලබා නොදෙන බව ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය හට දැනුණි. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘති කණ්ඩායම, ව්‍යාපෘති උපදේශක කමිටුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙහි සමානාත්මතාවය, කාන්තා අයිතිවාසිකම් භුක්ති විඳීම සහ කාන්තාවන් සවිබල ගැන්වීම ඇති කිරීමට හැකි උපාය මාර්ගික සහ නවමු ආකාරවල මූලාරම්භයන් පිළිබඳ පරීක්ෂා කිරීම, නියාමනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම අරභයා කඩිනම් ප්‍රතිචාර අරමුදලෙහි ආකෘතිය සංශෝධනය කරන ලදී. "නවෝත්පාදන ප්‍රදානය" (Innovative Grant) (එය සංශෝධන වලින් පසුව හැඳින්වූ ආකාරය), ආර්ථික අර්බුදය ඇතුළු (නමුත් එයට පමණක් සීමා නොවී) විවිධ තේමා ක්ෂේත්‍ර යටතේ ගැටලු විසඳීම සඳහා භාවිතා කළ හැකි අතර, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි හවුල්කාර නොවන කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන අතර අයදුම්පත් කැඳවීමක් සිදු කරන බව ද දැනුම් දෙන ලදි. මොනරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි (නවෝත්පාදන ප්‍රදානලාභී) විකල්පනී ජාතික කාන්තා සම්මේලනය (Vikalpani) විසින් සම්ප්‍රදායික බීජ අභිජනන සහ අලෙවිකරණ යෝජනා ක්‍රමයක් තුළින් කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන

ලදී. විකල්පනී සම්මේලනය විසින් පෝෂණ අගය, දේශගුණික ප්‍රතිරෝධය සහ විවිධත්වය හේතුවෙන් පාරම්පරික බීජ සඳහා ඉල්ලුමක් පවතින බව හඳුනා ගෙන තිබුණි. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය (WDC) විසින් පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වතුකර ප්‍රජාවෙහි කාන්තාවන් "ස්වයං උපකාරක කණ්ඩායම්" හරහා එකතු කරවීමට, කිරි ගොවිතැන සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට, කිරි නිෂ්පාදන ගබඩා කිරීමේ පහසුකම් ඇති කිරීමට සහ එළවලු වගාව වැඩිදියුණු කිරීමට සහ කාබනික පොහොර නිෂ්පාදනය හා අළෙවි කිරීම සඳහා ගොවි කාන්තාවන් පුහුණු කිරීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

කෙසේ වුවද, මානුෂීය ආධාර සඳහා කරන ලද ඉල්ලීම්වලට, විශේෂයෙන් ආර්ථික අර්බුදයේ අවදානමට ලක් වූ කාන්තාවන් සහ ගැහැණු ළමයින් කණ්ඩායම්වලට ඇති වූ අසමමිතික, ඇතැම් විට සැඟවී ඇති බලපෑම් ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් ඉල්ලීම්වලට සහය දැක්වීමේ අවශ්‍යතාවය ද ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් හඳුනාගෙන ඇත. මේ සඳහා,  ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘති කණ්ඩායම විසින් ඉන්සයිඩ් ජස්ටිස් (Inside Justice) ව්‍යාපෘති කණ්ඩායම (මෙම කණ්ඩායම් දෙකම ආසියා පදනමෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ යුක්තිය වැඩසටහන යටතේ ක්‍රියාත්මක වේ) වෙත Lotus Circle හි ක්ෂණික අරමුදල (ආසියා පදනමෙහි අභ්‍යන්තර අරමුදල් මූලාශ්‍රයක්) හරහා, මෙම ආර්ථික අර්බුදය තුළ සිය ප්‍රජාවන් තුළ වර්ධනය වන ආධාර පිළිබඳ වූ අවශ්‍යතාවයන්ට කඩිනම්  ප්‍රතිචාර දැක්වීමට කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට වැඩි අවස්ථා නිර්මාණය කිරීම අරභයා අරමුදල් රැස් කිරීමට සහාය දක්වන ලදි. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන අතර "ශ්‍රී ලංකාවේ කාන්තා මූලික නිවාස සඳහා වන ආර්ථික සහන පැකේජය" නමින් වූ ක්ෂණික ආධාර ව්‍යාපෘතිය සඳහා අයදුම්පත් කැඳවීම පිළිබඳ තොරතුරු බෙදාහරින ලදි. ගෙවතු වගාව සහ ආහාර සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් තෝරාගත් කාන්තා ගෘහ මූලිකත්වයක් පවතින නිවාස සඳහා ආර්ථික සහනයක් සැපයීම අරමුණු කරගෙන ලබා දෙන මුදල් දීමනාවක් සහ ගෙවතු වගාව සහ ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ලබා දෙන ආරම්භක බීජ පැකට්ටුවකින් මෙම ආධාරය සමන්විත විය.

මේ සමඟින්, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් විසින් මානසික සෞඛ්‍යයෙහි යහපැවැත්ම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් සහ ගෘහස්ථ හිංසනවලට අදාළ සේවා සපයන්නන්ගේ සම්බන්ධතා තොරතුරු ඇතුළත් කර ගනිමින් ආසියා පදනම විසින් සකස් කරන ලද පත්‍රිකා ද බෙදා හරින ලදී. මෙම සහය ලබාදීම හරහා තෝරාගත් නිවාස වෙත තාවකාලික සහන ලබා දීමටත්, කාන්තාවන්ට තම ස්වාධීනත්වය භාවිතා කර එම මුදල් තමන්ට සුදුසු යැයි හැඟෙන පරිදි වියදම් කිරීම හරහා කෙටි කාලීනව තම නිවසේ වියදම් සඳහා සහය වීමට මෙන්ම මධ්‍ය කාලීනව තම නිවෙස්වල ආහාර අවශ්‍යතාවයන්වලදී තමන් විසින්ම ඒවා සපුරා ගැනීම තුළින් සුබසාධන වැඩසටහන් සහ මානුෂීය ආධාර හරහා බොහෝ විට නිර්මාණය කර ඇති 'යැපෙන / සුබසාධනය මත රඳා පවතින' මානසිකත්වය අඩු කරවීම අපේක්ෂා කරයි.




ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියේ හවුල්කරුවන් වන කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන 15ක් හරහා කාන්තා ගෘහමූලිකත්වයක් දරන නිවාස සඳහා ලබාදෙන ලද ආරම්භක බීජ පැකට්ටුව

හදිසි ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා, තම ප්‍රදේශ තුළ සිටින රජයේ පාර්ශවකරුවන් සමඟ වැඩ කිරීමට සහ හදිසි ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පුරාවට ඔවුන් විසින්

සහයෝගය දැක්වීම සහතික කිරීම සඳහා ඔවුන් සමඟ නිරන්තර සබඳතාවයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් දිරිමත් කරවන ලදි. රජයේ පාර්ශ්වකරුවන් සමඟ ඇති සහයෝගීතාවය සහ ජාලයන් ශක්තිමත් කිරීම සඳහා, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් ඔවුන් විසින් සකස් කරන ලද නිර්ණායක මත පදනම්ව සුදුසු / අවදානමට ලක්ව ඇති කාන්තා ගෘහ මූලිකත්වයක් පවතින නිවාස තෝරා ගැනීම සඳහා ඊට අදාළ බිම් මට්ටමේ නිලධාරීන් (උදා: දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාන්තා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරී, සමාජ සේවා නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන්) ඇතුළත් තේරීම් කමිටු පිහිටුවීමත්, කාන්තා ගෘහ මූලිකත්වයක් පවතින නිවාසවලට පුහුණුව ලබා දීම සඳහා කෘෂිකර්ම නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීමත් සිදු කළේය. විවිධ ගැටලු ඉස්මතු කිරීමට, ප්‍රතිලාභීන් සමඟ සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා ඔවුන්ගේම ශක්තිය අවබෝධ කර ගැනීමට ඔවුන් දිරිමත් කිරීමට සහ අර්බුදය අතරතුර ඔවුන්ගේ මූල්‍ය, නිවාස හා මානසික යහපැවැත්ම කළමණාකරණය කරගැනීමට ප්‍රායෝගික කුසලතාවන් ඇති කරවීම සඳහා කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් (මුදල් ප්‍රදානයන්, බීජ ආරම්භක පැකට්ටු සහ තොරතුරු පත්‍රිකා ප්‍රතිලාභීන් අතර බෙදා දුන්) බෙදා හැරීමේ උත්සවය භාවිතා කළහ.

### අර්බුද අතරතුර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල මූල්‍යමය හා පරිපාලනමය බාධාවන් ආමන්ත්‍රණය කිරීම

#### කෝවිඩ් 19 වසංගතය අතරතුර

වසංගතය පැවති මුල්ම කාලවල බොහෝ හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් හට ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ගැටලුවලට මුහුණ දීමට සිදු වුවද, තම කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ හැකියාව සහ වැඩ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමේ අරමුණින්, හවුල්කාර කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවල ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් සහ දීමනා අඛණ්ඩව ගෙවීම ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් සහතික කරන ලදි. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙහි මෙම උත්සාහයන් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් බෙහෙවින් අගය කරනු ලැබුවේ ඔවුන්ගේම කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමට ඔවුන් සතුව සම්පත් නොතිබූ බැවිනි.

කෙසේ වුවද, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන්හි මූල්‍ය හැකියාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට තවත් ගැටලුවක් ඇති විය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අසම්පූර්ණව ඇති අවස්ථාවලදී ව්‍යාපෘති හවුල්කරුවන් සමඟ පිරිවැය නොලැබෙන දීර්ඝ කිරීමේ ගිවිසුම්වලට (No Cost Extension – NCE) එළඹීම සාමාන්‍ය පුරුද්දක් වුවද, බහු වාර්ෂික අරමුදල් ප්‍රදාන චක්‍රයෙහි පළමුවන අදියරේ සිට ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා NCE ගිවිසුම් පවත්වා ගෙන යාමට බොහෝ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට මූල්‍ය හැකියාවක් නොතිබුණු අතර එය වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඉස්මතු වූ ගැටලුවක් විය. මෙයට පිළියමක් ලෙස, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් ව්‍යාපෘති නිමා කිරීමට තීරණය කළ අතර, තනි තනි වශයෙන් කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන සමඟ සාකච්ඡා කර, සිදු කිරීමට ඉතිරිව ඇති ක්‍රියාකාරකම් බහු වාර්ෂික අරමුදල් චක්‍රයේ දෙවන අදියරේ දී ක්‍රියාත්මක කිරීමට තීරණය කළේය. මෙම ප්‍රවේශයේ ප්‍රතිලාභ දෙයාකාර විය: එය කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානවලට අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට දෙවන අවස්ථාවක් සලසා දුන් අතර තීරණාත්මක කාලයකදී පිරිවැය නොලැබෙන දීර්ඝ කිරීමක් (NCE ගිවිසුමක්) තුළ කාර්යය මණ්ඩලය රඳවා තබා ගැනීම සඳහා වෙනත් අරමුදල් මූලාශ්‍ර සෙවීමේ ගැටලුව අඩු කරවන ලදි. කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන සඳහා මූල්‍ය තිරසාරභාවය පිළිබඳ අවම ප්‍රමිතීන් සහ සුදුසුම භාවිතයන් සැකසීමේ දැඩි අවශ්‍යතාවය මෙම ගැටලුව හරහා පිළිබිඹු විය. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් එක් සංවිධානයක මූල්‍ය තක්සේරුවක් ලබාගැනීම හරහා එම සංවිධානය (අනුරාධපුර ප්‍රදේශයෙහි ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය - (AKASA)) සමඟින් මෙය ආරම්භ කළ අතර එහි දී සංවිධානයේ ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට සහ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීමට එම තක්සේරුව උපකාරී විය.

### ආර්ථික අර්බුදය අතරතුර

ආර්ථික අර්බුදයේ ක්ෂණික බලපෑමක් වූයේ උද්ධමනයේ ප්‍රතිඵලයක් ලෙස අධික වශයෙන් වියදම් ඉහළ යාමයි. වෙනස්වන තත්ත්වයන්ට අනුකූලව හවුල්කරුවන්ගේ අයවැය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් එහි දී ඇති විය. මේ වෙත ප්‍රවේශයක් ගැනීමේදී, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් මේ සඳහා එක් එක් සිද්ධියට අදාළ ලෙස කටයුතු කළ අතර මෙම වෙනස්කම් පිළිබිඹු වන ආකාරයෙන් අයවැය (විශේෂයෙන් ගමනාගමනය සඳහා) සහ ප්‍රදානයන් සඳහා වන ගිවිසුම් සංශෝධනය කිරීමට හවුල්කරුවන් සමඟ කටයුතු කළේය.

### සන්දර්භයන්ට ගැළපෙන පරිදි හවුල්කරුවන් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේද අලුත් කිරීම

ව්‍යාපෘතිය තුළ හවුල්කරුවන් අධීක්ෂණය සඳහා සැළසුම් කළ ප්‍රධාන ආකාරය වූයේ ඔවුන් හමුවීමට යාමයි. කෙසේ වුවද, කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පැනවුණු සංචරණ සීමාවන් සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් නිරන්තරයෙන් සිදු කිරීම සඳහා "තනි තනි වශයෙන් හවුල්කරුවන් සමඟ සිදුකරන සාකච්ඡා" පද්ධතියක් ගොඩනගන ලදී. මෙම තනි තනි හවුල්කාර සාකච්ඡා මෙවලම මඟින් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට විශේෂිත ප්‍රදේශ තුළ කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේදී හවුල්කාර පාර්ශවයන්ගේ අත්දැකීම්, මුහුණ දුන් අභියෝග සහ ඒවාට විසඳුම් සෙවීම සඳහා අනුගමනය කරන උපාය මාර්ග අවබෝධ කර ගැනීමට; ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් සිදුකළ ක්‍රියාකාරකම් ප්‍රයෝජනවත් වී ඇත්ද යන්න තේරුම් ගැනීමට; ආයතනික කළමනාකරණය සහ මෙහෙයුම්, උපදේශනය සහ සේවා සැපයීම, සහ ජාලකරණය සම්බන්ධයෙන් හවුල්කාර සංවිධානයේ ධාරිතා අවශ්‍යතා සහ ධාරිතා ප්‍රමුඛතා සාකච්ඡා කිරීමට ප්‍රයෝජනවත් විය.

## බලාපොරොත්තු වනු ප්‍රතිඵල සහ ජයග්‍රහණ

### ඉලක්කගත ප්‍රතිලාභීන් ප්‍රමාණය ඉහළ යෑම

කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් ප්‍රතිලාභීන් වැඩි සංඛ්‍යාවක් හා සම්බන්ධ නොවනු ඇතැයි අපේක්ෂා කළ අවස්ථාවක, ශ්‍රී ලංකාව තුළ පැවති කෝවිඩ් 19 තත්ත්වයන්ට ගැලපෙන පරිදි තම වැඩ කටයුතු අනුගත කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන පහකට බලාපොරොත්තු නොවූ තරමේ ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සමඟ සම්බන්ධ වීමට හැකි විය. සාමාන්‍යයෙන් සිංහල භාෂාව කතා කරන අපනයන සැකසුම් කලාපයක (Export Processing Zone – EPZ) සේවිකාවන් සමඟ වැඩකටයුතු කරන ගාල්ල දිස්ත්‍රික්කයේ කාන්තාවන් සඳහා වන මධ්‍යස්ථානයට, ඔවුන් සතු වූ අභ්‍යන්තර සම්පත් භාවිතා කරමින් අතිකාල වැඩ කිරීමේ නීතිමය ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම ඇතුලත් අත් පත්‍රිකාවන් පරිවර්තනය කර බෙදා හැරීම හේතුවෙන් කටුනායක අපනයන සැකසුම් කළාපයේ සහ වව්නියා දිස්ත්‍රික්කයේ දමිළ භාෂාව කතා කරන ප්‍රතිලාභීන් සමඟ ද සම්බන්ධ වීමට හැකි විය. වවුනියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කාන්තා සංසදය (RWF) විසින් වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය කාන්තා සංවර්ධන ඒකකයේ රාජ්‍ය නිලධාරීන් සමඟ එක්ව ගම තුළ (පාසල් වැසීම හේතුවෙන් පාසල් වෙනුවට) දැනුවත්භාවය වැඩි කිරීමේ කටයුතු සිදු කරමින් වැඩි කාන්තාවන් හා ගැහැණු දරුවන් සංඛ්‍යාවක් සමඟ සම්බන්ධ විය. මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (MWDT) විසින් ද විශේෂයෙන් වසංගතය අතරතුර ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ට අදාළ සිද්ධිවල වැඩිවීම හේතුවෙන් උපදේශන සහ නීති ආධාර සේවා අපේක්ෂා කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ වැඩි වීමක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකාවේ කාන්තා ගෘහ මූලිකත්වයක් සහිත නිවාස සඳහා වන ආර්ථික සහන පැකේජය යන හදිසි සහනය හරහා  දිස්ත්‍රික්ක 11ක් පුරා සිටින කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන 15කට ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ

තොරතුරු, මුදල් දීමනා සහ ආරම්භක බීජ පැකට්ටු සමඟ කාන්තා ගෘහ මූලිකත්වයක් සහිත නිවාසයන් හි කාන්තාවන් 1,150 කට ආසන්න සංඛ්‍යාවක් සමඟ සම්බන්ධ වීමට හැකි විය. මෙම හදිසි ආධාර හරහා, ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියට සහ කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් හට නව සෘජු ප්‍රතිලාභීන් (කාන්තා ගෘහ මූලිකත්වයක් පවතින නිවාස) සහ වක්‍ර ප්‍රතිලාභීන් (දරුවන්, වැඩිහිටි දෙමාපියන් / ඥාතීන්, සහ ආබාධිත/ගිලන් ව සිටින ස්වාමිපුරුෂයන් / හවුල්කරුවන් ඇතුළු ඔවුන්ගේ යැපෙන්නන්) කොටසක් වෙත Lotus Circle හි හදිසි අරමුදල සමඟ එක්වීම ඔස්සේ ළඟා වීමට හැකි විය.

## කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන්හි වැඩිදියුණු වූ ධාරිතාවයන් සහ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතියෙන් ඔබ්බට කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබා දීම

ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය මඟින් දේශපාලන අර්බුදයන්හි දී කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන්හි මැදිහත්වීම සහ "අරගලය" (ශ්‍රී ලංකා රජයේ දූෂිත හා අකාර්යක්ෂම භාවයට ප්‍රතිචාරයක් ලෙස ගොඩනැගුණු මහජන ව්‍යාපාරය, එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා ඔහුගේ පවුලට විරුද්ධව ඇති වූ ප්‍රතිචාරයක් ලෙස ඇරඹුණි) තුළ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය හඳුනා ගන්නා ලදි. ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය දේශපාලන ක්‍රියාකාරීත්වයට සම්බන්ධ නොවූ අතර දේශපාලන අර්බුදය අතරතුර දී කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධාන විසින් කරන ලද කාර්යයන්ට අරමුදල් හෝ තාක්ෂණික විශේෂඥතාව සැපයීම හරහා සෘජු සහය ද නොදක්වන ලදි. එනමුත්, ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ කාන්තා නියෝජනය අඩු වීම ද සැලකිල්ලට ගනිමින්, කාන්තා අයිතිවාසිකම් සඳහා වන සංවිධානයන් විසින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය තුළට ස්ත්‍රීවාදී මූලධර්ම ඇතුළත් කිරීමට ගත් උත්සාහයන් ශ්‍රී ලංකාවේ කාන්තා හඬ හා නායකත්වය ව්‍යාපෘතිය විසින් අගය කරයි. වෙනත් සංවිධාන සහ ක්‍රියාකාරීන් සමඟ විධිමත් හා අවිධිමත් ජාල ගොඩනඟා ගැනීම, ප්‍රජාව තුළ ඔවුන්ගේ දෘශ්‍ය බව වැඩි කරගැනීම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා වැඩියෙන් කාන්තාවන් ඇතුළත් කර ගැනීම, සහ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන් තුළින් කාන්තා අයිතිවාසිකම් සඳහා ඇති පිළිගැනීම ඉහළ දැමීමට කටයුතු කිරීම හවුල්කරුවන් සිදු කළහ.

In partnership with Canada

The Asia Foundation

**ව්‍යාපෘතිය ගැන:** ශ්‍රී ලංකා කාන්තා හඬ සහ නායකත්ව ව්‍යාපෘතිය, කැනේඩියානු රජයේ අරමුදල් මගින් ආසියා පදනම විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි. කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම, කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවමය සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන කාන්තා නායකත්වයක් යටතේ පවතින දේශීය කාන්තා අයිතීන් පිළිබඳ කටයුතු කෙරෙන සංවිධානවල ක්‍රියාකාරකම් සඳහා ධාරිතාව වර්ධනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

**මෙම ලේඛනය ගැන:** ශ්‍රී ලංකාවේ කාන්තා හඬ සහ නායකත්වය ව්‍යාපෘතියේ සන්නිවේදන උපාය මාර්ගයේ අංගයක් ලෙස ගොඩනගන ලද "ප්‍රවේශය පිළිබඳ සටහන් පත්‍රිකා" නම් වූ විස්තර පත්‍රිකා මාලාව, ව්‍යාපෘති කණ්ඩායම විසින් විවිධ ව්‍යාපෘති අරමුණු ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරන ලද ප්‍රවේශයන්, සාක්ෂාත් කරගත් ප්‍රතිඵල, දැනුම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය අතරතුර උගත් පාඩම් පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි. මෙම ලේඛනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ගමන් මඟ තුළ ගැඹුරු චින්තනයක් සහිත මාර්ගෝපදේශයක් ලෙස කටයුතු කරන අතර එහි ජයග්‍රහණ හැඩගැස්වීමේදී ස්ත්‍රීවාදී ප්‍රවේශයන්ගේ වැදගත්කම අවධාරනය කරයි.

කාන්තා හඬ සහ නායකත්වය - ශ්‍රී ලංකාව
ආසියා පදනම
30/1, බගතලේ පාර, කොළඹ 3
දුරකථන: +94 11 2058701
විද්‍යුත් තැපෑල: wvl@asiafoundation.org